# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2073/38 - 2018 මැයි මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2018.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට බණ්ඩාරවෙල - දියතලාව ජල සම්පාදන ක්‍රමයේ ඩයරබා වත්ත ප්‍රධාන ජල ටැංකිය ඉදිකිරීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 අප්‍රේල් මස 23 වැනි දින,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1366

**උපලේඛනය**

බදුල්ල දිස්ත්‍රික්කයේ, වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 58D ඩයරබා වත්ත ග්‍රාම නිලධාරී වසමේ, ඩයරබා වත්ත ගමේ පිහිටි ඩයරබා වත්ත පහල කොටස ක්ෂෙත්‍ර අංක 05 නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 80ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස ඃ

| | | |
|---|---|---|
| *උතුරට* | ඃ | ඩයරබා තේ වත්ත ; |
| *නැගෙනහිරට* | ඃ | ඩයරබා තේ වත්ත ; |
| *දකුණට* | ඃ | ඩයරබා තේ වත්ත හා ප්‍රවේශ මාර්ගය ; |
| *බටහිරට* | ඃ | ඩයරබා තේ වත්ත. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය ඃ*

සී/ස මල්ලවත්ත වැවිලි සමාගම,
ඩයරබා වත්ත,
මීරහාවත්ත - වැලිමඩ.

06 -656

1A - G 27775— 40 (2018/05)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මලාපවහන ව්‍යාපෘතිය යටතේ අංක 3 පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්තර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 අප්‍රේල් මස 23 වැනි දින,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.

5/2/2/1367

**උපලේඛනය**

කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර කොට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 519- නුගේගොඩ ග්‍රාම නිලධාරී වසමේ පාගොඩ පාර ගමේ පිහිටි දියවන්නා උද්‍යාන පාරේ අංක 29 නිවාස ඉඩමට යාබඳ ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 10ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස ඃ

| | | |
|---|---|---|
| *උතුරට* | ඃ | වැල්ලබඩ පෙදෙස මාර්ගය ; |
| *නැගෙනහිරට* | ඃ | වැල්ලබඩ පෙදෙස මාර්ගය හා අංක 29 දරන නිවාස ඉඩම ; |
| *දකුණට* | ඃ | දියවන්නා උද්‍යාන පාර ; |
| *බටහිරට* | ඃ | දියවන්නා උද්‍යාන පාර හා හිමිකරුවෙකු නොදන්නා හිස් ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන්* ඃ සොයාගත නොහැක

06 -657

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මලාපවහන ව්‍යාපෘතිය යටතේ අංක 2 පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්තර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 අප්‍රේල් මස 23 වැනි දින,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1363

**උපලේඛනය**

කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර කොට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 514B රාජගිරිය, ග්‍රාම නිලධාරී වසමේ ශ්‍රී ජයවර්ධනපුර මාවත පිහිටි දියවන්නා පෙදෙස ගමේ අංක 981/5B නිවාස ඉඩමට ඉදිරිපස ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 12ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | අංක 981/5B දරන නිවාස ඉඩම ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | අංක 981/5C දරන නිවාස ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන්* : සොයාගත නොහැක

06 -658

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.